# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 508 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/03/2024 පැය 1105

## මාධ්‍ය නිවේදනය

### සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී.

එම මෙහෙයුම් මඟින්, 2024.03.22 වන දිනය තුල සිදු කරන ලද වැටලීම් වලදී සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 11 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**ඒ අනුව මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19** වන දින **සිට 2024.03.22** වන **දින දක්වා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 38 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මෙම සැකකරුවන් රැඳවුම් නියෝග මත රඳවා තබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.**

මෙම විශේෂ මෙහෙයුමේ නිරත නිලධාරීන් විසින් 2024.03.19 වන දින සිට 2024.03.22 වන දින දක්වා සිදු කරන ලද වැටලීම් වලින් පිස්තෝල වර්ගයේ ගිනි අවියක් සහ එම පතරොම් 06 ක්ද පොලිස් භාරයට ගෙන ඇත.

- 2024.03.22 වන දින දහවල් කාලයේදී සිරිසරු උයන මහල් නිවාස සංකීර්ණය අසලදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 580 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු සහ ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 41 හා 39 වයස්වල පසුවන ඔරුගොඩවත්ත හා බොරැල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

- 2024.03.22 වන දින සවස් කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ දී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද විදේශීය දුම්වැටි 1600 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන කොට්ටරාමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

  **මත්ද්‍රව්‍ය හා දුම්වැටි සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**